**ශීර්ෂය - 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125 (1) (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

ශීර්ෂය 215-කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කර ගෙන අදාල පාර්ශවයන් වෙත කාර්ය සාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන විගණන වාර්තාව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරිමේ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේ දි අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත.එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2:15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරිමේ දි අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව හා ගණන්දිමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | | |
| 128 (1)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබු කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩ සටහන සම්පූර්ණ කිරිමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. | අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.9.1 |
| | | 2. | ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.13 |
| | | 3. | අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම. | 2.4 |
| | | 4. | ක්‍රියාත්මක කර තිබූ විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධ අඩුපාඩු | 2.3 |
| | | 5. | මහජනයා වෙත සේවා ඉටුකිරීමේ අඩුපාඩු | 2.8 |
| | | 6. | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.15 |

| | | | | |
|---|---|---|---|---|
| 128(1) (ආ) | තම දෙපාර්තමේන්තුවේ මුල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරිමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරිමට ද, රජය වෙනුවෙන් බැඳීම් සඳහා බලය දිමටද ඉටු කරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරිමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිමේ අඩුපාඩු. | 2.4 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දි පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදි ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. | ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.13 |
| | | 2. | අනුකූල නොවිම. | 2.14 |
| | | 3. | කල් ඉකුත් වූ තැන්පතු | 2.11 |
| 128(1)(ඈ) | ලැබිම්, ගෙවීම් හා නිකුත් කිරිම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය කලින් කල සෝදිසි කරන බව | 1. | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10 |
| | | 2. | බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.12 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වු හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනිම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ අඩුපාඩු | 2.3(අ) |
| | | 2. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.5(ආ) |
| | | 3. අනාරක්ෂිත දේපල | 2.5(ඇ) |
| | | 4. බාහිර පාර්ශවයන් වෙත මුදාහල වත්කම් | 2.5(ඈ) |
| | | 5. අවිධිමත් ලෙස පවරා තිබූ වත්කම් | 2.5(ඉ)<br>2.5(ඊ) |
| | | 6. වාහන උපයෝජනය | |
| | | 7. රජයේ නිවාස පාලනය | 2.5(උ) |
| 128(1)(ජ) | නිලධාරින්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වි ඇති අවස්ථාවලදි මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසි වල නියම කර ඇති කාර්ය පටිපාටිය ගණන් දිමේ නිලධාරින් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156 (1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්/ සේවකයින් මත අධිභාර පනවනු ලබන බව | පාඩු හා හානි | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

(i) කාර්මික අධ්‍යාපනය හා ඒ සම්බන්ධ පුහුණු වැඩසටහන් හඳුනා ගැනිම, සකස් කිරිම, ක්‍රියාත්මක කිරිමට මඟ පෙන්විම , අධික්ෂණය හා සම්බන්ධීකරණය.

(ii) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරිම වඩාත් ඵලදායි හා කාර්යක්ෂම කිරිම සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය.

(iii) කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු සිදු කිරිම , තොරතුරු තාක්ෂණය භාවිතය ප්‍රචලිත කිරීම හා නව නිපැයුම් සඳහා අවකාශ සලසා දීම.

(iv) කාර්මික අධ්‍යාපනය හා පුහුණු ක්‍රමය තුල අනුමත ජාතික වෘත්තිය සුදුසුකම් රාමුවට අනුව පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

(v) වෘත්තිය මාර්ගෝපදේශනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ ඒකාබද්ධ ක්‍රියාකාරි වැඩසටහන් සැකසිම, සම්බන්ධිකරණය හා ක්‍රියාත්මක කිරීම.

### 2.2 කාර්යසාධනය

#### (අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(i) සමාලෝචිත වර්ෂයේ දි දෙපාර්තමේන්තුව විසින් ඉටු කල යුතු ප්‍රධාන කාර්යයන් 05 ක් පැවැති අතර, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනිම සඳහා තාක්ෂණ විද්‍යාල 09 කට හා කාර්මික විද්‍යාල 30 කට අදාලව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම අනුව එහි කාර්යසාධනය පහත දැක්වේ.

(ii) **තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනිම**

තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනිම පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවිම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනිමට කටයුතු කර නොතිබුණි.

#### (ආ) කාර්මික / තාක්ෂණ විද්‍යාලවලට සිසුන් බඳවා ගැනිම හා පාඨමාලා පැවැත්විම

සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්මික / තාක්ෂණ විද්‍යාල 39 හි පාඨමාලා 125 ක් පැවැත්විමටත් ඒ සඳහා සිසුන් 27,000 ක් බඳවා ගැනිමටත් සැලසුම් කර තිබුණි. ඒ අනුව 2016 ඔක්තෝබර් 14 හා 2016 දෙසැම්බර් 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රවල සිංහල, දෙමළ, ඉංග්‍රිසි, ජපන් හා කොරියන් භාෂා මාධ්‍යයන්ගෙන් පාඨමාලා 102 ක් සඳහා අයඳුම් පත් කැඳවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ පාඨමාලා 119 ක් සඳහා සිසුන් 33,650 ක් බඳවා ගෙන තිබුණි. මෙම බඳවා ගැනීම් පසුගිය වර්ෂයේ බඳවා

ගත් සිසුන් 26,591 ක් හා සැසඳීමේදී සිසුන් 7,059 ක ප්‍රගතියක් ලබා තිබුණි. එමෙන්ම බඳවා ගැනීමට සැලසුම් කරන ලද සිසුන් සංඛ්‍යාව සත්‍ය බඳවා ගැනීම් සමග සැසඳීමේදී ද දෙපාර්තමේන්තුව ප්‍රගතියක් ලබා තිබුණි. කෙසේවෙතත් මුළු පාඨමාලා සංඛ්‍යාවෙන් පාඨමාලා 21 ක් සඳහා සිසුන් 4,210 ක් බඳවා ගැනීමට සැලසුම් කලද සත්‍ය වශයෙන් බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 1,538 ක් වීමෙන් එම පාඨමාලාවලට සිසුන් බඳවා ගැනිම සැලසුම් ගත සංඛ්‍යාවෙන් සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පැවතුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ Advancing Career Skills, Building Career Skills, Developing Career Skills, CEB electrical Course ඇතුළු පාඨමාලා 25 ක් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණි. ඒ සඳහා සිසුන් 8,830 ක් එනම් බඳවාගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 26 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ පැවැත් වූ පාඨමාලා අතරින් වැඩිම සිසුන් ගණනක් සහභාගී වූ පාඨමාලා ද ඒ අතර පැවතුණි.

(iii) සිසුන් 3,405 ක් බඳවා ගැනීමට සැලසුම් කරන ලද ගොඩනැගිලි ඉදි කිරීම් පිළිබඳ ජාතික සහතිකය, මෝටර් සයිකල් හා ස්කූටර් අළුත්වැඩියාව, අලෙවි නියෝජිත සහායක, ගබඩා සහකරු ඇතුළු පාඨමාලා 14 ක් කිසිදු තාක්ෂණ/කාර්මික විද්‍යාලයක පවත්වා නොතිබුණි.

(iv) ගැසට් පත්‍රයේ පල කරන ලද පාඨමාලා 102 අතරින් පාඨමාලා 15 ක් පවත්වා නොතිබුණ අතර ගැසට් පත්‍රයේ පල නොකරන ලද පාඨමාලා 21 ක් පවත්වා තිබුණි.

(v) 2016 නොවැම්බර් 03 දිනැති අංක DTET/05/01/02(i)/2016 දරන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය අනුව කාර්මික/ තාක්ෂණ විද්‍යාලවල පාඨමාලාවන් සඳහා පවත්වා ගත යුතු ආරම්භක අවම ශිෂ්‍ය සංඛ්‍යාව කර්මාන්තශාලා / විද්‍යාගාර පදනම මත වූ වෘත්තිය පාඨමාලා සඳහා සිසුන් 15 ක් ද, පන්ති කාමර පාදක පාඨමාලා සඳහා සිසුන් 30 ක් ද වුවත් අවම ශිෂ්‍ය සංඛ්‍යාව නොමැතිව පාඨමාලා 39 ක් පවත්වා තිබුණි. තවද 2017 ජනවාරි 31 දිනැති අංක DTET/05/01/02(II)/2017 දරන ලිපිය අනුව සති අන්ත/ දීර්ඝ කාලින පාඨමාලා සඳහා සිටිය යුතු අවම සිසුන් සංඛ්‍යාව 30 ක් වුවත් ඊට අඩු සංඛ්‍යාවකින් පාඨමාලා 51 ක් පවත්වා තිබුණි.

**(ඇ) පාඨමාලා ප්‍රතීතනය**

----------------------

2013 පෙබරවාරි 26 දිනැති අංක 01/2013 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛය අනුව සියළුම වෘත්තිය පාඨමාලා ප්‍රතීතනය කළ යුතු වේ. එසේ වුවද, විගණිත දිනය වූ 2018 අගෝස්තු 15 දිනට තාක්ෂණ/කාර්මික විද්‍යාල 39 හි පවත්වාගෙන යනු ලබන පාඨමාලා 871 කින් පාඨමාලා 272 ක් තවමත් ප්‍රතීතනය කර නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රතීතනය නොකරන ලද පාඨමාලා හදාරණ සිසුන්ට පාඨමාලාව අවසන් කර විද්‍යාලයෙන් ඉවත්ව යන විටත් ජාතික මට්ටමේ සහතිකයක් ලබා ගැනීමේ අවස්ථාව මගහැරී යන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**(ඈ) සිසුන් පාඨමාලා හැරයාම**

---------------------------

විගණනයට ලබා දී තිබුණු තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ බඳවා ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වූ සිසුන් 28,961 කින් (ගාස්තු අයකරන පාඨමාලා සඳහා වූ සිසුන් හැර) සිසුන් 7,291 ක් හෙවත් සියයට 25 ක් පාඨමාලා හැරගොස් තිබුණු බවට නිරීක්ෂණය විය. මෙම සංඛ්‍යාවෙන්

පාඨමාලා 07 ක සිසුන් පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය ඒ සඳහා ලියාපදිංචි සිසුන්ගෙන් සියයට 50 ටත් වඩා වැඩි විය. තවද සමාලෝචිත වර්ෂය තුළ දී ගාස්තු අය කරන අර්ධ කාලීන / සන්ධ්‍යාකාලීන පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන් 4,489 කගෙන් සිසුන් 1,774 ක් ද, එනම් සියයට 39 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.

**(ඉ) විභාග ප්‍රතිඵල**

----------------

2018 සැප්තැම්බර් 11 දින කාර්මික/ තාක්ෂණ විද්‍යාල 16 ක විභාග ප්‍රතිඵලවලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කෙරුණු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුල ඉහත විද්‍යාල 16 හි සිසුන් 10,224 ක් විභාගවලට පෙනී සිට තිබුණ අතර ඉන් සමත් සිසුන් ගණන 5,041 ක් එනම් සියයට 49 ක් විය. මෙම විද්‍යාල අතරින් අනුරාධපුරය හා බදුල්ල කාර්මික විද්‍යාලවල විභාගවලට පෙනී සිටි සිසුන්ගෙන් පිළිවෙලින් සියයට 71 ක් හා 62 ක් අසමත් වී තිබුණි.

(ii) ඉහත විද්‍යාල 16 හි පාඨමාලා 114 ක විභාගවලට පෙනී සිටි සිසුන් 2,697 කගේ විභාග ප්‍රතිඵල විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 25 දින වන විටත් නිකුත් කර නොතිබුණි. මේ හේතුවෙන් සිසුන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු ප්‍රමාද වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ඉහත විද්‍යාලවල පාඨමාලා 29 ක විභාගවලට සිසුන් 584 ක් පෙනී සිටිය ද ඔවුන් සියලු දෙනාම අසමත් වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණ / කාර්මික විද්‍යාල 23 ක පවත්වන ලද විභාග ප්‍රතිඵල විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් විද්‍යාලවල සමස්ථ ප්‍රතිඵලය ඇගයීමට ලක් කිරීමට නොහැකි විය.

**(ඊ) තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම**

------------------------------------------------

තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති

------------------------------------------

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්මික හා තාක්ෂණික විද්‍යාලවල ගොඩනැගිලි ඉදිකිරීම හා නවීකරණය කිරීම, උපකරණ මිලදී ගැනීම හා අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව රු. මිලියන 524.70 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණු අතර ඉන් රු. මිලියන 244.39 ක් හෙවත් සියයට 47 ක් උපයෝජනය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි 27 ක ප්‍රතිසංස්කරණය හා නවීකරණය වෙනුවෙන් රු. මිලියන 356 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් වැය කර තිබුනේ රු. මිලියන 167 හෙවත් සියයට 47 ක් පමණක් විය. අදාල ඉදිකිරීම් වලින් සැලසුම් කල පරිදි අවසන් කර තිබුනේ ඉදිකිරීම් 16 ක කටයුතු පමණි. කෙසේවෙතත් විගණිත දිනය වූ 2018 අප්‍රේල් 30 දින වන විට ගොඩනැගිලි 09 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබුණ ද කොන්ත්‍රාත්කරුවන් බිල්පත් ඉදිරිපත් නොකිරීම හා මිණුම් කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් එම කොන්ත්‍රාත්වලට අදාල ගෙවීම් අවසන් කල නොහැකි වී තිබුණු බව විගණනයේ දි නිරීක්ෂණය විය.

(ආ) කොන්ත්‍රාත් වටිනාකම පිළිවෙලින් රු. මිලියන 26.85 ක් හා රු. මිලියන 67.20 ක් වූ මොණරාගල කාර්මික විද්‍යාලයේ අදියර 1 හා 2 ගොඩනැගිලිවල වැඩි දියුණු කිරීම් හා වව්නියාව තාක්ෂණ විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු 2018 අප්‍රේල් 30 දින වන විටත් නිම කර නොතිබුණි.

(ඇ) මන්නාරම කාර්මික විද්‍යාලයේ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 9.97 ක් වූ කාර්ය මණ්ඩල නේවාසිකාගාර ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු අවසන් වුව ද අමතර වැඩ කොටස්වල වියදම ඇස්තමේන්තු ගත වියදම ඉක්මවා ඇති බැවින් බිල් පත් ගෙවීම් ප්‍රමාද කර තිබුණු අතර මරදාන තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිරීම් ආයතනයේ (TITP) රු. මිලියන 10.04 ක් වූ ගොඩනැගිලි වැඩි දියුණු කිරීමේ කටයුතු ද ඇස්තමේන්තු ගත වියදම ඉක්මවා තිබුණු බවට නිරීක්ෂණය විය.

(ඈ) මරදාන තාක්ෂණ විද්‍යාලයේ ගොඩනැගිලි වැඩි දියුණු කිරීම් කටයුතු සියයට 95 ක් වැඩ අවසන් කර තිබුණු ද නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදි කිරීම් සිදු වී නොමැති බැවින් ගිවිසුම අවලංගු කර අදාල කාර්ය සාධන ඇපකරය වූ රු. 1,147,446 ක් දෙපාර්තමේන්තුව විසින් අය කර ගෙන තිබුණි. මේ වන විට ගොඩනැගිල්ල පරිහරනය කරනු ලැබුවද ගෙවීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) හෝමාගම කාර්මික විද්‍යාලයේ ඉදිකිරීම් සඳහා ගෙවිම් කිරීමේ දී වූ වැරදි ගණනය කිරීම් හේතුවෙන් රු. 63,088 ක් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි.

(ඊ) පසුගිය වර්ෂයේ දි මිලදී ගැනිමට සැලසුම් කර තිබුණු උපකරණ එම වර්ෂයේ දී මිලදී නොගෙන තිබිම හේතුවෙන් එම උපකරණ මිලදී ගැනිමට සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 60 ක් ප්‍රතිපාදනය කර තිබුණි. එයින් රු. මිලියන 41.435 ක් වටිනා උපකරණ පමණක් මිලදී ගෙන තිබුණු අතර ඉතිරි රු. මිලියන 18.565 උපයෝජනය කර නොතිබුණි.

(උ) නුවර එළිය කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික ශිල්පී (Mechanist) පාඨමාලාව සඳහා රු. මිලියන 19.89 කට (VAT රහිතව) 2017 මාර්තු 16 දින මිලදී ගෙන තිබුණු CNC Milling යන්ත්‍රය එම පාඨමාලා ඉගැන්වීම සඳහා ස්ථිර උපදේශකවරයෙකු නොමැති වීම හේතුවෙන් විගණිත දිනය වූ 2018 අගෝස්තු 30 දින වන විටත් නිශ්කාර්යයව පැවතුණි.

(ඖ) සමාලෝචිත වර්ෂයේ දි උපකරණ මිලදී ගැනිම සඳහා රු. මිලියන 70 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද එයින් මිලදී ගෙන තිබුනේ රු. මිලියන 15.054 ක් වටිනා උපකරණ පමණක් විම හේතුවෙන් රු. මිලියන 54.946 ක් හෙවත් සියයට 79 ක් උපයෝජනය කර නොතිබුණි.

(ඓ) සමාලෝචිත වර්ෂයේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා විදේශ පුහුණුකරුවන් මඟින් සිසුන් පුහුණු කර මැදපෙරදිග රැකියා වෙළඳපලට යොමු කිරිමට සැලසුම් කිරිම සඳහා රු. මිලියන 2 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද එම මුදල උපයෝජනය කර නොතිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයිම් හා සේවා ලබා ගැනිම

**2.4.1** දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් ලබා ගත යුතු වූ සැපයිම් හා සේවා සඳහා රු. මිලියන 323.8 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 249.4 ක ප්‍රතිපාදන පහත පරිදි උපයෝජනය කර තිබුණි.

| වැය විෂය | | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|---|
| | | | රු.මිලියන . | රු.මිලියන . | රු.මිලියන . |
| | | **සැපයීම්** | | | |
| 1201 | - | ලිපි ද්‍රව්‍ය කාර්යාල අවශ්‍යතා | 23.6 | 23.2 | 0.4 |
| 1203 | - | ආහාර පාන හා නිල ඇඳුම් | 1.0 | 1.0 | 0.0 |
| 1205 | - | වෙනත් | | | |
| | | **මූලධන වත්කම් අත්පත් කර ගැනිම** | 22.0 | 21.4 | 0.6 |
| 2102 | - | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 24.0 | 23.0 | 1.0 |
| 2103 | - | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 13.2 | 13.1 | 0.1 |
| 2104 | - | ගොඩනැගිලි ඉදි කිරිම | 240 | 167.6 | 72.4 |
| | | එකතුව | **323.8** | **249.4** | **74.4** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කල පරිදි ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු සිදු නොකිරිම හේතුවෙන් ප්‍රතිපාදිත මුදලින් රු. මිලියන 72.4 ක් හෙවත් සියයට 23.4 ක් ඉතිරි වි තිබුණි.

(ආ) අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා විසර්ජන පනතින් ප්‍රතිපාදන සලසා නොගෙන ලබා ගත් රු. මිලියන 70 ක අතිරේක ප්‍රතිපාදනයෙන් 2017 වර්ෂය තුල රු. මිලියන 68 ක් වියදම් කර තිබුණි. එම ඉදිකිරීම් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස අවසන් කල යුතු වුවත් වර්ෂය අවසානයට ලඟා කර ගෙන තිබුනේ සියයට 65 ක භෞතික ප්‍රගතියක් පමණි. කෙසේ වෙතත්, 2018 වර්ෂයේ මේ සඳහා ප්‍රතිපාදන සලසා ගැනිමට නොහැකි වීම හේතුවෙන් ඉතිරි වැඩ ක්‍රියාත්මක කිරිම තාවකාලිකව නවතා තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගෙන යනු ලැබූ පර්යේෂණ හා ඇගයිම් අංශය වෙනත් ස්ථානයකට ස්ථාපිත කිරිම සඳහා රු.මිලියන 15 ක් ප්‍රතිපාදනය කර තිබුණ අතර විසර්ජන ගිණුම අනුව ඉන් රු.මිලියන 13.21 ක් එනම් ප්‍රතිපාදන වටිනාකමින් සියයට 88 ක් ඉතිරි වි තිබුණි. නිසි සැලසුමකින්

තොරව ආරම්භ කරන ලද එම ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රු. 566,400 ක් වැය කර තිබුණ අතර මෙම කාර්යයට අදාල නොවූ රු. 1,227,165 ක් ද එම වියදම්වලට ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත් අදාල ඉදිකිරීම් අතර මඟ නවතා දමා කොන්ත්‍රාත් ගිවිසුම ද අවලංගු කර තිබුණි.

### 2.4.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආනමඩුව කාර්මික විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා පසුගිය වර්ෂයේ රු. මිලියන 50 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද ඉන් කිසිදු මුදලක් එම වසර තුල උපයෝජනය කර නොතිබුණි. කෙසේ වුවද ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී ද රු. මිලියන 139 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර එයින් රු. මිලියන 78.23 ක් එනම් සියයට 56 ක් වියදම් කර තිබුණ ද 2017 දෙසැම්බර් 31 දිනට එහි ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය.

(ආ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් නුවරඑළිය කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික ශිල්පී පාඨමාලාව සඳහා පසුගිය වර්ෂයේ දී රු. 22,876,575 කට මිලදී ගැනිමට සැළසුම් කරන ලද CNC. Milling යන්ත්‍රය සඳහා 2017 මාර්තු 16 දින රු. 17,903,407 ක් ද ඉතිරි මුදල හා එකතු කළ අගය මත බද්ද ද එකතුව රු. 4,973,168 ක් ද 2018 ජනවාරි 05 දින සැපයුම් කරු වෙත ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 වර්ෂයට අදාලව සියලු තාක්ෂණ / කාර්මික විද්‍යාලවලට අවශ්‍ය උපකරණ හා භාණ්ඩ මිලදී ගැනිමට සැළසුම් කිරීමේ දී නුවරඑළිය කාර්මික විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ හා මිලදි ගැනිම් සඳහා පත් කල කමිටු සාමාජිකයන්ගේ ඉල්ලීමක් ද නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකුගේ නිර්දේශ මත මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 (ඇ) මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් තාක්ෂණ ඇගයීම් කමිටුවේ එක් සාමාජිකයෙකු අදාල රේඛීය අමාත්‍යාංශයේ හෝ ප්‍රසම්පාදන විෂය සම්බන්ධ දැනුමක් ඇති බාහිර පුද්ගලයකු විය යුතු වුවත් මෙම ඇගයීම් කමිටුවට එවැනි පුද්ගලයකු පත්කර නොතිබුණි.

(ii) එකතු කල අගය මත බදු (VAT) සහිතව වටිනාකම රු. මිලියන 22.87 ක් වූ මෙම යන්ත්‍රය මිලදී ගැනිමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කල යුතු වුවත් එසේ කර නොතිබුණු අතර සැළසුමකින් තොරව මිලදී ගත් මෙම යන්ත්‍රය හැසිරවීම සඳහා සුදුසු උපදේශකවරයෙකු නොමැති වීම හේතුවෙන් විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 15 දින දක්වාම මෙය නිශ්ක්‍රීයව පැවතුණි.

(iii) මෙම යන්ත්‍රය භාවිතා කරනු ලබන්නේ වර්ෂයකට පැය 12 ක යන්ත්‍රය හඳුන්වාදීමේ දේශන සඳහා පමණක් වන බව බැවින් රු.මිලියන 2,287 ක් වැයකර යන්ත්‍රය මිලදී ගැනීම වෙනුවට එම කාර්යය බදුල්ල හා මහනුවර තාක්ෂණ/කාර්මික විද්‍යාලවලින් ද ආවරණය කර ගැනිමේ හැකියාවක් පැවති බව අදාල නිලධාරීන් සමඟ කරන ලද සාකච්ඡාවලදී ද තහවුරු විය.

(iv) මෙම යන්ත්‍රය මිලදී ගැනිම සඳහා 2016 අප්‍රේල් 04 දින පල කරන ලද පුවත්පත් දැන්වීමට අනුව 2016 අප්‍රේල් 20 දින පැවැත්වීමට නියමිතව තිබූ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම පැවැත්වූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(v) මේ සඳහා මිල ගණන් කැඳවීමේ දී ආයතන දෙකකින් පමණක් මිල ගණන් ලැබී තිබුණු අතර අවම වගකීම් කාලය වසර 3 වෙනුවට එක් වසරක් වීම හේතුවෙන් මිල ගණන් සැසඳීමකින් තොරව හා ලංසුකරුවන්ගේ ලිඛිත පැහැදිලි කිරීම් ලබා ගැනීමකින් තොරව තාක්ෂණ ඇගයීම් කමිටු විසින් එක් ලංසුකරුවෙකු ප්‍රතික්ෂේප කර අනෙක් ලංසුකරු වෙතින් එම යන්ත්‍රය මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණි. එම තීරණයට ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ද ලබා දී තිබුණි. ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) මාර්ගෝපදේශය අනුව උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි සලසා ගැනිම යන අරමුණු ඉටු වී තිබුණු බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(vi) කොන්ත්‍රාත් ගිවිසුමේ 4 ඡේදය ප්‍රකාරව දින 45 ක් ඇතුළත යන්ත්‍රය ලබාදිය යුතුව තිබුණි. 2016 ජුනි 28 දින කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර තිබූ අතර එදින සිට දින 239 ක කාලයක් ප්‍රමාද කර 2017 පෙබරවාරි 22 දින කොන්ත්‍රාත්කරු විසින් යන්ත්‍රය සපයා තිබුණි. තවද, එම යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය ස්ථානයක් සකස් කිරීමට හා එම ස්ථානයට අවශ්‍ය වායු සමීකරණ හා විදුලිය සැපයීම සඳහා තවත් දින 242 ක් ගතවී තිබුණි. ඒ අනුව දින 481 ක කාලයක් ප්‍රමාද කර 2017 ඔක්තෝබර් 20 දින යන්ත්‍රය සවිකර තිබුණි. විශාල කාල පමාවකින් පසුව යන්ත්‍රය සවිකර තිබුණත්, එම ප්‍රමාද කාලය සඳහා කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(vii) ටෙන්ඩර් කොන්දේසි 16.2 (අ) අනුව අදාල කොන්ත්‍රාත් සමාගමට යන්ත්‍රයේ වටිනාකමින් සියයට 90 ක් ගෙවිය හැකි වන්නේ යන්ත්‍රය පිරිවිතරවලට අනුකූල බව, යන්ත්‍රය සවි කර ඇති බව හා යන්ත්‍රය මනා තත්වයෙන් ක්‍රියාකාරි වන බවට තාක්ෂණ ඇගයීම් කමිටුවේ තහවුරුවකින් පමණක් වුවත් ඊට පටහැනිව යන්ත්‍රයේ වටිනාකමින් සියයට 90 ක් ගෙවා තිබුණි. තවද යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ කිසිඳු තහවුරුවකින් තොරව 2018 ජනවාරි 05 දින රඳවා ගැනිමේ තැන්පතු මුදල වූ රු. 1,989,267 ක මුදල ද සැපයුම්කරු වෙත නිදහස් කර තිබුණි.

(viii) යන්ත්‍රය ස්ථාපිත කර විගණිත දිනය වූ 2018 අගෝස්තු 30 දින වන විට දින 313 ක් ගත වී තිබුණ ද එම යන්ත්‍රය උපයෝජනය කර තිබුනේ පැය 30 ක කාලයක් සඳහා යන්ත්‍රය පිළිබඳ දැනුවත් කිරිමේ මුලික පුහුණුවක් සඳහා පමණක් විය.

(ix) එම යන්ත්‍රය සඳහා 2018 ජනවාරි 05 දින එකතු කල අගය මත බදු මුදල වූ රු. 2,983,901 ක් අදාල සමාගමට ගෙවා ඇතත් 2018 සැප්තැම්බර් 18 දින දක්වාම සැපයුම්කරු විසින් එම මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණු බවට ද නිරීක්ෂණය විය.

(x) එම යන්ත්‍රය මිලදි ගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ දි නුවරඑළිය කාර්මික විද්‍යාලය විසින් ඉල්ලුම් කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු. 7,363,500 ක උපකරණ 2018 අගෝස්තු 30 දින වන විටත් විද්‍යාලයට ලබා දි නොතිබුණු අතර එම උපකරණ නොලැබීම මත මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණු කටයුතු සඳහා සිසුන් මහනුවර කාර්මික විද්‍යාලය වෙත රැගෙන යාමට සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(xi) යන්ත්‍රය මිලදී ගැනිමට පෙර එම යන්ත්‍රය ස්ථාපිත කිරිමට සුදුසු ස්ථානයක් සකස් නොකිරීම හේතුවෙන් ඇළුමිනියම් පිළිසකරකරනය පිළිබඳ පාඨමාලාව හදාරන සිසුන් විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 03 දින වන විටත් වෙනත් ගොඩනැගිල්ලක් පාඨමාලාව පවත්වා ගෙන යාමට සිදු වී තිබුණි. තවද ඒ සඳහා භාවිතා කල උපකරණ ඌන උපයෝජිතව පවතින අතර සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුවීම්වලට ද බාධා සිදු වන බව විගණනයේ දී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරයා විසින් 2017 මාර්තු 22 දින යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත දන්වා තිබුණ ද විගණිත දින වූ 2018 සැප්තැම්බර් 03 දිනට දින 530 ක් ගත වී තිබුණ ද ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(xii) මෙම යන්ත්‍රය උපයෝජනය සඳහා පුහුණු පාඨමාලා නොවුව ද යන්ත්‍රය ක්‍රියා විරහිතව තැබිමෙන් යන්ත්‍රය අක්‍රිය වීමට ඉඩ ඇති බැවින් අවම වශයෙන් දිනකට පැය 3 ක් හෝ 4 ක් ක්‍රියාත්මක කරන බැවින් අමතර විදුලි ගාස්තුවක් ද දැරීමට දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. තවද මෙම යන්ත්‍රය නිශ්කාර්යව තැබිම හේතුවෙන් එම යන්ත්‍රයෙහි වගකීම් කාලය ද අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**2.5 වත්කම් කළමනාකරණය**

**---------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවේ දි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

**-------------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.7 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයන්ගෙන් හෙළිදරව් වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන එම කටයුතු අවසන් කර 2018 ජුනි 30 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත් ප්‍රධාන කාර්යාලයේ ගබඩාව හා අනෙකුත් අංශ 17 ක් හා කාර්මික/ තාක්ෂණ විද්‍යාල 39 ක ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් එසේ දැනුම් දීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රියව පැවැති බව වත්කම් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ආයතනය | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|
| හෝමාගම කාර්මික විද්‍යාලය | වාහන ඉසිලීමේ යන්ත්‍රය | 01 | වර්ෂ 01 |
| මහනුවර තාක්ෂණ විද්‍යාලය | CNC Milling යන්ත්‍රය | 01 | වර්ෂ 08 |
| බදුල්ල කාර්මික විද්‍යාලය | CNC Lathe යන්ත්‍රය | 01 | දක්වා නැත |
| | CNC turning (ලියවන) යන්ත්‍රය | 01 | |
| දඹුල්ල කාර්මික විද්‍යාලය | වායු හා තාප පැස්සුම් යාන්ත්‍රික ලී වැඩ හා පෙදරේරු කර්මාන්තශාලාවල ඇති | | දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | උපකරණ | | |
| මොණරාගල කාර්මික විද්‍යාලය | පරිගණක | 21 | දක්වා නැත. |
| | පුස්තකාල පොත් | 471 | |
| අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | ජල පෙරන යන්ත්‍ර | 03 | වර්ෂ 03 |

| | ප්‍රමාණය | වත්කම පිහිටි ස්ථානය | වත්කම් ලබා දී ඇති ආයතනය | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| ➢ | අක්කර 10 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය- වැවේතැන්න ඉඩම | විශ්වවිද්‍යාල විද්‍යායතනය | අවශ්‍ය මැනීම් කටයුතු හා පිඹුරුපත් සැකසීම සිදු කර නොතිබුණි. |
| ➢ | අක්කර 08 | - එම - | යොවුන් සේනාංකය | විධිමත් පවරා දීමක් සිදු කර නොතිබුණි. |
| ➢ | පර්චස් 110 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලයේ පිහිණුම් තටාකය | ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරියෙක් විසින් භාර ගෙන ඇතත් විධිමත් ලිපියක් කාර්මික විද්‍යාල වෙත ලබාදී නැත. |
| ➢ | පර්චස් 9.5 | කෑගල්ල කාර්මික විද්‍යාලය | බාහිර පුද්ගලයෙකු | 1997 වර්ෂයේදී වසර 30 කට බදු දී ඇතත් බදු ගිවිසුම දෙපාර්තමේන්තුවේ නොතිබුණි. |
| ➢ | පර්චස් 6.8 | - එම - | බාහිර පුද්ගලයෙකු | බාහිර පුද්ගලයෙකු විසින් බලෙන් පදිංචිවී ඇත. ඒ සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 04 දින විදුහල්පතිවරයාගේ විරුද්ධත්වය දක්වා ඇතත් දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි. |
| ➢ | අක්කර 05 | - එම - | යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | විධිමත් පවරා දීමක් සිදු කර නොතිබුණි. |
| ➢ | අක්කර 1.5 | - එම - | විවෘත විශ්වවිද්‍යාලය | නීත්‍යානුකූලව පවරා දී නොතිබුණි. |
| ➢ | රූඩ් 3 පර්.3.9 | රත්මලාන කාර්මික විද්‍යාලය | විශ්වවිද්‍යාල විද්‍යායතනය | විධිමත් පවරා දීමක් සිදු කර නොතිබුණි. |

**(ඇ) අනාරක්ෂිත දේපල**

වීරවිල කාර්මික විද්‍යාල භූමිය වටා විධිමත් ආරක්ෂිත වැටක් ඉදි නොකිරීම හේතුවෙන් විද්‍යාල භූමියේ ඇති දේපල අනාරක්ෂිතව පවතින බවට අභ්‍යන්තර විගණන වාර්තාවල සඳහන් කර ඇත.

(ඇ) **බාහිර පාර්ශවයන් වෙත මුදාහැර ඇති වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ඉඩම් බාහිර පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු අතර එම වත්කම් මුදාහැරි දිනයන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) කොරියානු ආධාර යටතේ 2014 වර්ෂයේ දි දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු ජීප් රථයක් දෙපාර්තමේන්තුවේ කටයුතුවලට යොදා නොගෙන අදාල රේඛීය අමාත්‍යාංශයට මුදාහැර තිබුණි.

(ඉ) **අවිධිමත් ලෙස පවරා දී තිබුණු වත්කම්**

රේඛීය අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යනු ලැබූ තාක්ෂණික වෘත්තිකයන්ගේ පුහුණු කිරීම් ආයතන (TITP) යෙහි ගොඩනැගිල්ල සහ ඊට අදාල වත්කම් 2016 පෙබරවාරි 02 දින සිට මෙම දෙපාර්තමේන්තුවට එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පවරා දී ඇතත් එය විධිමත් ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් පවරාදීමකින් තොරව වියදම් දරා තිබුණි.

(ඊ) **වාහන උපයෝජනය**

සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුව සතුව වාහන 69 ක් පැවැති අතර ඊට අවශ්‍ය ඉන්ධන ලිහිසි තෙල් සඳහා රු. මිලියන 19.74 ක් ද, වාහන සේවා කිරීම, අළුත්වැඩියා කිරීම හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.මිලියන 6.87 වශයෙන් එකතුව රු.මිලියන 26.61 ක් වැය කර තිබුණි. එම වාහනවලින් වාහන 17 ක් පරික්ෂාවේ දි වර්ෂය තුල කිලෝමීටර 128,631 ක් ධාවනය කර තිබුණි. රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝමීටරයක් සඳහා රු. 51 ක් වැය කර තිබුණි. ඉතිරි වාහන සම්බන්ධයෙන් විධිමත් පරිදි ලේඛන පවත්වා නොතිබීම හේතුවෙන් එම වාහන වර්ෂය තුල ධාවනය කරන ලද කිලෝමීටර ප්‍රමාණය, ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා වූ වියදම ආදි තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

ඉහත සඳහන් වාහන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බෙලිඅත්ත කාර්මික විද්‍යාලයට අනුයුක්ත කර තිබූ වාහනයක් 2011 මාර්තු 18 දින එන්ජිම අකර්මන්‍ය වීම හා 2011 ජුනි 05 දින එම විද්‍යාලයේ නවතා තිබියදී පසුපස වීදුරුව බිඳීයාම යන සිද්ධීන් දෙක හේතුවෙන් වාහනය යථා තත්වයට පත් කිරීම සඳහා රු.මිලියන 1.97 ක් වැයකර තිබුණි. 2014 ජුනි 25 දිනැති මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාවට අනුව අලාභයෙන් සියයට 40 ක් රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය වී තිබුණද 2018 අගෝස්තු 31 දින වන විටත් කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(ii) අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ මෝටර් කෝච් වර්ගයේ වාහනයක් 2012 සැප්තැම්බර් 27 දින එහි අධ්‍යක්ෂවරයා විසින් පදවාගෙන යන අවස්ථාවේ අනතුරට ලක්වී තිබුණු අතර එම වර්ගයේ වාහන (මෝටර් කෝච්) පැදවීම සඳහා අදාල වූ රියදුරු බලපත්‍රයක්ද ඔහු විසින් ලබාගෙන නොතිබුණි. එම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු. මිලියන 1.03 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2013 ජනවාරි 11 දිනැති මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාවට අනුව වාහනය සඳහා රියදුරකු පත්කර නොතිබීම හා සර්වග්‍රාහී රක්ෂණයක් කර නොතිබීම හේතුවෙන් අලාභයෙන් සියයට 50 ක් වාහනය පැදවූ අධ්‍යක්ෂවරයාගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව විද්‍යාලයේ අධ්‍යක්ෂවරයාගෙන් අයවියයුතු අලාභය 2018 අගෝස්තු 31 දින වන විටත් අය කර ගෙන

නොතිබුණි. 2017 ජුලි 23 දින සිට එම අධ්‍යක්ෂවරයා විශ්‍රාම ගොස් ඇති අතර එම වාහනයේ අලුත්වැඩියා වියදම හා සියයට 25 ක දඩ මුදල ඇතුළත්ව රු. 1,286,539 ක් ඔහුගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් රඳවා තබා ගෙන තිබුණ ද විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 15 දින වන විටත් අදාළ කටයුතු නිරවුල් කර නොතිබුණි.

(iii) 2011 දෙසැම්බර් 26 දින රු.462,450 ක් වැය කර අලුත්වැඩියා කරන ලද වාහනයක් එම අළුත්වැඩියාව සිදු කර කිලෝමීටර 1000 කට අඩු ප්‍රමාණයක් ධාවනය කර තිබිය දී එම රථයේ එන්ජිම 2012 මාර්තු මස සිට ක්‍රියාවිරහිත වී වර්ෂ 06 කට වැඩි කාලයක් ගත වී තිබුණද විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. මෙම අළුත්වැඩියාව නිසි පරිදි සිදු කර තිබෙන බවට තාක්ෂණ ඇගයිම් කමිටුවේ නිර්දේශ ද ලබා ගෙන නොතිබුණි. එසේම එම අළුත්වැඩියාව අදාල වගකිම් කාලය තුල සිදු වූ ක්‍රියා විරහිත වීමක් වූ බැවින් අළුත්වැඩියාව කල ආයතනයෙන් ඒ පිළිබඳව මැදිහත් වීමක් සිදු කිරීමට ද කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම අළුත්වැඩියා වියදම වූ රු. 462,450 ක් හා එන්ජිම පරීක්ෂණ වියදම රු. 10,000 ක් රජයට සිදු වූ පාඩුවක් ලෙස විගණනයේ දි නිරීක්ෂණය විය. තවද මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් ද සිදු කර නොතිබුණි.

**(උ) රජයේ නිවාස පාලනය**

-----------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව රජයේ නිවාස 260 ක් දෙපාර්තමේන්තුව සතුව පැවතුණු අතර ඒ සම්බන්ධයෙන්වූ නියැදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව නිවාස සඳහා බදු කාලය වර්ෂ 5 ක් වන අතර 7.2 වගන්තිය ප්‍රකාරව බදු කාලය ඉක්මවා පදිංචිව සිටින කාල පරිච්ඡේදය වෙනුවෙන් පොරොත්තු ලේඛනයේ ඉල්ලුම්කරුවන් සිටින අවස්ථාවලදී දන්ඩන කුලියක් අයකර ගත යුතු වූවත් අනුරාධපුර, නුවරඑළිය, මහනුවර, දෙහිඅත්ත කණ්ඩිය, ගාල්ල හා කෑගල්ල යන විද්‍යාලවලට හිමි නිලනිවාසවල නිලධාරීන් 16 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව සතු නිවාස ගණන, පිහිටි ස්ථානය, නිවාස වර්ගය, පදිංචි වී සිටින නිලධාරීන්ගේ විස්තර හා ගෙවන කුලී පිලිබඳ විස්තර සඳහන් ලේඛනයක් හා පොරොත්තු ලේඛනයක් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් නිල නිවාස පාලනය දුර්වල තත්වයක පැවතුණු බවට නිරීක්ෂණය විය.

(iii) විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව දෙපාර්තමේන්තුව සතු නිවාසවලින් 126 ක් නිසි පරිදි නඩත්තු නොකිරිම හේතුවෙන් අළුත්වැඩියා කටයුතු හා අබලන් තත්ත්වයේ පැවතුණු අතර එම නිවාස පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.6 බැදීම් හා බැරකම්**

-------------------

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම් වලට එළඹීම**

-----------------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට විසර්ජන ගිණුමේ දක්වා තිබුණු බැදීම් හා බැරකම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02((අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය රු. මිලියන 85 ක් වුවද ඒ සඳහා රු. මිලියන 148.8 ක බැඳීම් ඇතිකර ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 03 කට අදාලව උපරිම බැරකම් සීමාව රු. මිලියන 3.28 ක් වුවද එම උපරිම සීමාව ඉක්මවා රු. මිලියන 443.58 ක් දක්වා බැරකම්වලට එළඹී තිබුණි.

**2.7 පාඩු හා හානි**

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට විසර්ජන ගිණුමේ පාඩු හා හානි වශයෙන් රු. 5,173,327 ක් වාර්තා වී තිබුණු අතර ඉන් වටිනාකම රු 3,963,215 ක් වූ පාඩු හා හානි වර්ෂ 05 කට වඩා පැරණි වන අතර එම වටිනාකම් අය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.8 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

----------------------------------

තොරතුරු දැන ගැනිමේ පනතේ 23 වගන්තිය පරිදි සෑම පොදු අධිකාරියක් විධිමත් තොරතුරු නිලධාරියෙක් පත් කල යුතු වුවත් එසේ පත් කල බවට හා එමගින් මහජනයාට තොරතුරු ලබා දී තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම.**

--------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රුමිලියන . | රුමිලියන . | රුමිලියන . | |
| 2013 | පුනරාවර්තන | 1315.4 | 1170.3 | 145.0 | 11 |
| | මූලධන | 310.6 | 105.1 | 205.4 | 66 |
| | එකතුව | 1626.0 | 1275.5 | 350.4 | 22 |
| 2014 | පුනරාවර්තන | 1319.4 | 1313.7 | 5.6 | 0.4 |
| | මූලධන | 224.1 | 187.2 | 36.8 | 16 |
| | එකතුව | 1543.5 | 1500.9 | 42.4 | 2.7 |
| 2015 | පුනරාවර්තන | 1628.3 | 1597.8 | 30.5 | 1.9 |
| | මූලධන | 335.9 | 321.3 | 14.5 | 4 |
| | එකතුව | 1964.2 | 1919.1 | 45.0 | 2 |
| 2016 | පුනරාවර්තන | 1999.1 | 1941.6 | 57.5 | 2.9 |
| | මූලධන | 350.0 | 190.6 | 159.3 | 45.5 |
| | එකතුව | 2349.1 | 2132.2 | 216.8 | 9 |
| 2017 | පුනරාවර්තන | 1883.7 | 1799.9 | 83.9 | 4.5 |
| | මූලධන | 378.2 | 275.8 | 102.4 | 27 |
| | එකතුව | 2262.0 | 2075.7 | 186.3 | 8 |

2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මුළු ශුද්ධ ප්‍රතිපාදනය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට වඩා රු.මිලියන 87.1 ක අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දි මුලධන වියදම සඳහා වු ශුද්ධ ප්‍රතිපාදනය අනෙකුත් වර්ෂ හා සැසඳීමේ දී ඉහලම අගයක් ගන්නා බව නිරීක්ෂණය වන අතර මුලධන වියදම් පසුගිය වර්ෂය හා සැසඳීමේ දී රු.මිලියන 85.2 ක වැඩිවීමක් නිරීක්ෂණය වුයෙන් සමාලෝචිත වර්ෂයේදි සංවර්ධන කටයුතුවල වර්ධනයක් නිරීක්ෂණය විය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා සලසා දී තිබුණු රු. මිලියන 2,262 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2,075.7 ක් උපයෝජනය කර තිබුණ අතර රු. මිලියන 186.3 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

(ආ) වැය ශීර්ෂයේ මුළු ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක් වුවත් මෙහෙයුම් හා සංවර්ධනය සඳහා සලසා තිබුණු මුලධන ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 57 ක් හා සියයට 25 ක ඉතිරිවීම් නිරීක්ෂණය විය. සැලසුම් කළ පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකර නොතිබීම මෙම ඉතිරිවීම්වලට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### 2.10.1 පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 215011 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු මිලියන . | රුමිලියන . | රුමිලියන . | රුමිලියන . | රුමිලියන . | රුමිලියන . |
| 60.00 | 60.00 | 49.00 | 49.00 | 200.00 | 114.00 |

**හිඟහිටි ණය ශේෂ අයකර නොගැනිම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව (ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ණය ශේෂ හැර ) රු 3,218,939 ක් වු අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට 22 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.11 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 54.29 ක් විය. ඉන් වර්ෂ 2ක් ඉක්ම වූ රු. මිලියන 9.85 ක් වූ තැන්පතු 50 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.12 බැංකු ගිණුම් මෙහෙය වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අක්‍රිය බැංකු ගිණුම්

දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති මඟින් පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුම් 02 ක් 2015 ට පෙර සිට අක්‍රීයව පැවතුණු අතර, එම ගිණුම්වල ශේෂය රු. 63,150 ක් විය. එම අක්‍රීය බැංකු ගිණුම් වල ඇති මුදල් ශේෂ රාජ්‍ය ආදායමට බැර කර එම ගිණුම් අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි.

### (ආ) ගැලපුම් කල යුතු ශේෂ

දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ දි ක්‍රියාත්මක කර තිබුණු බැංකු ගිණුම් 40 කට අදාලව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේ දි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුම් 10 ක බැංකු ගිණුම් ශේෂවල එකතුව රු. 30,000 ක් ලෙස විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කරන ලද සටහන (iv) හි දක්වා තිබුණ ද, එම බැංකු ගිණුම්වල 2018 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂවල එකතුව රු. 7,749,547 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ හඳුනා නොගත් ලැබීම් රු. 229,943 ක් වූ අතර අම්පාර, කුලියාපිටිය විද්‍යාලවල හඳුනා නොගත් ලැබීම්වල එකතුව රු. 27,030 ක් විය.

## 2.13 ලේඛන හා පොත් පවත්වා නොගැනීම

දෙපාර්තමේන්තුව විසින් අදාල රෙගුලාසිය ප්‍රකාරව පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ඇපලේඛනය | මුදල් රෙගුලාසි (1) 891 | පවත්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන කමිටුවල කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ) 2.11.3අ( මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 | පවත්වා නොතිබුණි. |
| තාක්ෂණ කාර්මික විද්‍යාලවල පාඨමාලා ගාස්තු වෙනුවෙන් මුදල් ලැබීම් ලේඛනය | මුදල් රෙගුලාසි (4) 165 | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

**2.14 අනුකූල නොවීම්**

**2.14.1 නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XIV පරිච්ඡේදයේ (4:1) වගන්තිය | සංයුක්ත දීමනා ගෙවීමට අවම වශයෙන් රාජකාරී ස්ථානයෙන් බැහැරව සැතපුම් 7 කට වැඩිදුරක් ගමන් කල යුතු වුවද එය තහවුරු කරගත හැකි වන පරිදි ගමන් වියදම් වවුචර්වල දුර ප්‍රමාණය සඳහන් කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 139 (4) | සෑම ගෙවීමක් සඳහාම කුවිතාන්සියක් ලබා ගත යුතු වුවත් විද්‍යාල 06 ක අවස්ථා 77 ක දී රු. 926,416 ක වටිනාකමක් වූ ගෙවීම් සඳහා ලදුපත් ලබා ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 225 (1) | ගම්පහ කාර්මික විදුහලේ ගෙවීම් සඳහා අදාල නියමිත ආකෘති පත්‍ර භාවිතා නොකර සංයුක්ත දීමනා හා ප්‍රවාහන වියදම් ගෙවා තිබුණි. |

## 2.15 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

## 2.15.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය,තත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩි නඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත තත්‍ය පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් (බාහිර උපදේශකවරුන්ගේ ගෙවීම් හැර) රු. මිලියන 500.3 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 521,592ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,313 | 643 | 670 | - |
| (ii) | තෘතීය මට්ටම | 144 | 35 | 109 | 02 |
| (iii) | ද්වීතීය මට්ටම | 1,242 | 834 | 408 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,170 | 907 | 263 | 24 |
| **එකතුව** | | **3,869** | **2,419** | **1,450** | **38** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ අධ්‍යක්ෂවරු 05 දෙනාගෙන් 04 දෙනෙක් ද තාක්ෂණ විද්‍යාල 09 හි අධ්‍යක්ෂවරු 08 ක් හා අතිරේක අධ්‍යක්ෂවරු 07 ක් ද කාර්මික විද්‍යාලවල විදුහල්පතිවරු 30 න් 25 ක් ද උප විදුහල්පතිවරු 30 ම ද පුරප්පාඩුව පැවතුණි. තාක්ෂණ/කාර්මික විද්‍යාලවල කතිකාචාර්යවරු 274 දෙනාගෙන් 218 ක් ද උපදේශකවරු 897 න් 334 ක්ද වෘත්තීය උපදේශන නිලධාරීන් 22 ක් ද, රෙජිස්ටාර්වරු 39 දෙනාගෙන් 20 ක්ද එම පුරප්පාඩු අතර විය. මේ හේතුවෙන් තාක්ෂණ / කාර්මික විද්‍යාලවල අධ්‍යයන කටයුතු හා පරිපාලන කටයුතුවලට බාධාවන් සිදු වීන බවට විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) අතිරික්ත කාර්ය මණ්ඩලය 38 ක් වූ අතර ඉන් 17 ක් දෙපාර්තමේන්තුවේ අනුමත නොවූ කාර්යාල සේවක සේවය, මුරකරු, පරිඝනක ක්‍රියාකරු, පරිශ පාලක වැනි තනතුරුවලට පත් කර තිබුණි.

(ඇ) ස්ථිර කාර්ය මණ්ඩලයේ කතිකාචාර්යවරු හා උපදේශකවරුන්ගේ පුරප්පාඩු හේතුවෙන් කාර්මික හා තාක්ෂණික විද්‍යාලවලට බාහිර උපදේශකවරුන් පත් කර තිබුණු අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. 207,281,403 ක් බාහිර උපදේශක දීමනා වශයෙන් ගෙවා තිබුණි. එම දේශකවරුන් බඳවා ගැනීම විද්‍යාල පදනමින් සිදුවන අතර ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා දේශන පැවැත්වීමේදී පවතින කාර්යක්ෂම බව හා ඵලදායීතාවය පිළිබඳ ඇගයීමක් ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රමාණවත් පරිදි සිදුකර නොතිබුණි. තවද විද්‍යාලවලට බඳවා ගත් බාහිර දේශකයින්ගේ සුදුසුකම්වලට අදාල සහතික පත්වල පිටපත් සත්‍ය පිටපත් බවට තහවුරු කරගෙනද නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ තුන්වන පරිච්ඡේදයේ 3.8.2. වගන්තිය හා දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව ඒ ඒ ශ්‍රේණියට අයත් කාර්ය ස්ථානයක සේවය කළ යුතු උපරිම කාලපරිච්ඡේදය අනුව ස්ථාන මාරු ලබා දිය යුතු විය. කෙසේ වුවද අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වසර 10 ක සේවා කාලයක් ඉක්මවූ අධ්‍යන කාර්ය මණ්ඩලයේ 19 දෙනෙකු හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ 59 දෙනෙකු ද විය.